අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறியீடு / My Ref. PTF/01/Circular/01    ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.    දිනය / திகதி / Date 2020.03.28

චක්‍රලේඛ අංක: PTF/01

**සියලුම පළාත් ගරු ආණ්ඩුකාරවරුන්**
**සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්**
**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ**
**සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජාතික වැඩසටහන**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නව කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමට ප්‍රමුඛත්වය දෙමින්, සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස ජනාධිපති කාර්ය සාධක බලකාය, 2020 මාර්තු මස 23 වැනි දිනැති අතිගරු ජනාධිපතිතුමාගේ විධානය ප්‍රකාරව ස්ථාපිත කර ඇත. අදාළ විධානය අංක 2168/8 හා 2020/03/26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් ද ප්‍රකාශයට පත් කර ඇත.

02. එම කාර්යයන් හා කර්තව්‍යයන් කළමනාකරණය හා සම්බන්ධීකරණය සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ විශේෂ අධීක්ෂණය යටතේ පත්කළ එම කාර්ය සාධක බලකාය, ජනාධිපති විශේෂ නියෝජිත බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ සභාපතිත්වයෙන්, අදාළ පළාත්වල ගරු ආණ්ඩුකාරවරුන් හා අග්‍රාමාත්‍ය ලේකම් ඇතුලු අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්, අදාළ පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා අනෙකුත් අදාළ ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත වේ.

03. ශ්‍රී ලංකාවෙන් නව කොරෝනා වෛරසය තුරන් කිරීම සඳහා රජය විසින් ගෙන යන ජාතික වැඩපිළිවෙලට සමගාමීව සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන සේවාවන් අඛණ්ඩව සැපයීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් මහජනතාවගේ දෛනික අවශ්‍යතා සපුරාලීම මෙන්ම ජාතික ආර්ථිකය අඩපණ නොවී පවත්වා ගැනීමට කටයුතු කිරීම ද ප්‍රමුඛ වගකීම වේ. මීට අදාළව 2020.03.26 දිනැතිව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතූ ලිපියෙන් ද දැනටමත් දැනුවත් කිරීමක් සිදු කර ඇත.



කාර්යාලය / அலுவலகம் / Gen. Office 2575317 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax 2574143 2575454 2575310
විද්‍යුත් තැපෑල / ஈ மெயில் / E-mail secpm@pmoffice.gov.lk

04. ඒ අනුව, අතිගරු ජනාධිපතිතුමාගේ උක්ත විධානය ප්‍රකාරව හා 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනත අනුව පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ග්‍රාමීය මට්ටමේ සිට දිස්ත්‍රික් මට්ටම දක්වා වූ ක්‍රමානුකූලව සංවිධානය වූ වැඩපිළිවෙලක් සකස් කර, ඒ ඔස්සේ මහජන අවශ්‍යතා සපුරාලීමත්, ජාතික ආර්ථිකය ශක්තිමත්ව පවත්වා ගැනීමත් සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ.

**I. අත්‍යවශ්‍ය මහජන සේවා සම්පාදනය**

ජනතාවගේ දෛනික අවශ්‍යතාවන් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විදුලිබලය, ජල සම්පාදනය, කසළ කළමනාකරණය, ඛනිජ තෙල් හා ගෑස් සැපයීම සහ මගී ප්‍රවාහනය (දුම්රිය, ශ්‍රී ලංගම හා පුද්ගලික මගී ප්‍රවාහන සේවා) හා ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීම.

**II. අත්‍යවශ්‍ය ආහාර සහ ඖෂධ සැපයීම හා බෙදා හැරීම සහ එම ද්‍රව්‍යවල මිල පාලනය**

විවිධ සේවා සමුපකාර සමිති, සමුපකාර තොග වෙළඳ සංස්ථාව, පෞද්ගලික අංශයේ සුපිරි වෙළඳසැල්, කුඩා ප්‍රමාණයේ සිල්ලර වෙළඳසැල්, ග්‍රොසරි හා ආර්ථික මධ්‍යස්ථාන ඇතුළුව අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීමට අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින්, දේශීය එළවළු, සහල්, පළතුරු, බිත්තර, පොල්, ධාන්‍ය, මාළු, කිරි පිටි හා ළදරු කිරිපිටි යනාදී ආහාර ද්‍රව්‍ය හා ඖෂධ වර්ග (විශේෂයෙන් වැඩිහිටියන්ට හා ළදරුවන්ට) හිඟයකින් තොරව ජනතාවට සැපයීමට පියවර ගැනීම. එමෙන්ම, එම ද්‍රව්‍ය සඳහා සාධාරණ ස්ථාවර මිලක් පවත්වාගෙන යාම ද සැලකිල්ලට ගත යුතුය.

ආර්ථික වශයෙන් දුෂ්කරතාවලට පත්ව සිටින සියලුම දිළිඳු පවුල් හඳුනාගෙන ඔවුන් සඳහා සහන සැලසීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළක්, සිවිල් සංවිධාන හා පෞද්ගලික අංශය සම්බන්ධීකරණය කර ගනිමින් ක්‍රියාත්මක කිරීම.

**III. ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත්ව පවත්වාගෙන යාම**

කෘෂි, වැවිලි, ධීවර, පශු සම්පත්, ග්‍රාමීය කර්මාන්ත, ස්වයං රැකියා ඇතුළු සියලු ක්ෂේත්‍රයන් ආවරණය වන සේ, අදාළ කටයුතු සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් ද සැලකිල්ලට ගනිමින්, මහජනතාවට ස්වකීය ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව යෙදීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

**IV. ජාතික ආර්ථිකය ශක්තිමත්ව පවත්වාගෙන යාම**

රාජ්‍ය හා පෞද්ගලික බැංකු, ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන අපනයන කර්මාන්ත, නිෂ්පාදන කර්මාන්ත හා අනෙකුත් ව්‍යාපාර, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උපදෙස් හා නියාමනයන්ට අනුකූලව ඒවායේ නිෂ්පාදන හා සේවා සැපයීම යථා පරිදි පවත්වා ගෙන යාම.

05. ඉහත සඳහන් කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ මඟ පෙන්වීම යටතේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවීම මගින් ඵලදායි යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම සඳහා නොපමාව පියවර ගත යුතුය. ඒ අනුව, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන මෙම යාන්ත්‍රණය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය මට්ටමේ සියලු රාජ්‍ය ආයතන, සිවිල් සංවිධාන ද ඇතුළත්ව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතු වේ. මේ සඳහා ප්‍රාදේශීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන හඳුනාගන්නා ක්ෂේත්‍ර නියෝජනය කිරීමට වෙනත්

සුදුසු නියෝජිතයන් ඇතුළත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් කටයුතු කළ යුතුය. අවශ්‍ය පරිදි අදාළ අමාත්‍යාංශවල සහයෝගය ද මේ සඳහා ලබාගත යුතු වේ.

06. තව ද, ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සම්බන්ධීකරණ කමිටුවේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ, එක් එක් නිලධාරියෙකුට කළමනාකරණය කළ හැකි අයුරින් ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් නිවාස 25-50ක් ඇතුළත් වන සේ "නිවාස කළමනාකරණ ඒකක" වලින් යුත් ග්‍රාමීය කමිටුවක් පිහිටුවිය යුතු ය. එම කමිටු මඟින් "අපේ ගම රැක ගනිමු" යන තේමාව යටතේ නව කොරෝනා වෛරස් උවදුරෙන් ගම රැක ගැනීම සඳහා උචිත ග්‍රාමීය කළමනාකරණ වැඩසටහන් සකස් කළ යුතුවේ. ඒ තුළින්, ඇඳිරි නීතිය ඉවත් කරන කාලය තුළ අනවශ්‍ය ලෙස ජනතාව එක්රැස්වීම වළකාලීම සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කල යුතු අතර , දේශීය නිෂ්පාදන සඳහා ප්‍රමුඛතාවය දෙමින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පහසුවෙන් මිල දී ගැනීමට පහසුකම් සැලසීමට කටයුතු කිරීම තුළින් සියලු ජනතාවගේ මූලික අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා පියවර ගත යුතුය.

07. ග්‍රාමීය මට්ටමෙන් සකස් කරනු ලබන කමිටුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ වගකීම වනු ඇත. එම අවශ්‍යතා සැලකිල්ලට ගෙන සකස් කරනු ලබන ප්‍රාදේශීය කළමනාකරණ වැඩසටහනේ ප්‍රගතිය ජනාධිපති කාර්ය සාධක බලකායේ මෙහෙයුම් මධ්‍යස්ථානය වෙත යොමු කිරීම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ක්‍රියා කළ යුතුවේ.

08. ජනාධිපති කාර්ය සාධක බලකායේ මෙහෙයුම් මධ්‍යස්ථානය අරලියගහ මන්දිරයේ පිහිටුවා ඇති අතර, එය පැය විසිහතර (24X7) පුරා ක්‍රියාත්මක වේ (**ඇමුණුම බලනු මැනවි**).

09. පවතින ව්‍යසනකාරී තත්වයෙන් අප රට කඩිනමින් මුදවා ගැනීම සඳහා ඉහත පරිදි ක්‍රියාමාර්ග අප්‍රමාද ව ගැනීමේ වැදගත්කම අවධාරණය කරමි. මේ පිළිබඳ ඔබ දක්වන ප්‍රමුඛ අවධානය බෙහෙවින් අගය කොට සලකමි.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම
මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය

**<u>පිටපත්</u>** :

| | | |
|---|---|---|
| 01. | ජනාධිපති ලේකම් | කාරුණික දැන ගැනීම සඳහා |
| 02. | අමාත්‍ය මණ්ඩල ලේකම් | |
| 03. | විගණකාධිපති | |
| 04. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් | කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 05. | ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් | |
| 06. | පොලිස්පති | |
| 07. | අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | |

අ.පි.බ.

<u>සටහන :</u>

ඉහත සඳහන් අංක: 04 ඡේදයෙන් ආවරණය කිරීමට අපේක්ෂිත එක් එක් ක්ෂේත්‍රයන් සඳහා පිහිටුවා ඇති අනු කමිටු හා ප්‍රධාන මෙහෙයුම් කමිටු නිලධාරීන් පහත සඳහන් දුරකථන අංක මගින් ඇමතිය හැකි බව කාරුණිකව සැලකුව මැනවි.

- **ප්‍රධාන මෙහෙයුම් කමිටුව** : දුරකථන අංකය *011-4354881*
  ෆැක්ස් *011-2333066*

  නලිනි කොහොවල මෙය : *071-3683370*

- **අත්‍යවශ්‍ය ආහාර හා ඖෂධ සැපයීම හා බෙදාහැරීමේ කමිටුව**

  දුරකථන අංකය *011-3456200 - 204*

  එස්.සී. ජගත් මහතා : ජංගම *071-8608297*

- **අත්‍යවශ්‍ය මහජන සේවා සම්පාදනය කිරීමේ කමිටුව**

  වන්දන පතිරගේ මහතා : ජංගම *071-3373538*

- **ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත්ව පවත්වා ගෙන යාමේ කමිටුව**

  එෆ්.ඒ. ෆාතිමා ෆර්සානා මහත්මිය : ජංගම *077-7005446*

- **ජාතික ආර්ථිකය ශක්තිමත්ව පවත්වා ගෙන යාමේ කමිටුව**

  ප්‍රියංග නානායක්කාර මහතා : ජංගම *077-7851491*

- ***පොදු දුරකථන අංක*** : *011-4733600*
  *011-4354754*
  *011-4354854*